**පරන්තන් කෙමිකල්ස් සමාගම - 2016**
**-----------------------------------------------**

පරන්තන් කෙමිකල්ස් සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදුකිරීමේදී ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් කර ඇත.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 2 මූල්‍ය ප්‍රකාශන

--------------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට පරන්තන් කෙමිකල් සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

2016 ජූනි මාසයේ සිට විනය හේතුන් මත කර්මාන්ත හා වානිජ අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු කර යවා තිබූ නිළධාරිණියගේ මාසික දල වැටුප වශයෙන් සමාගම සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ රු.323,547 ක මුදල අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

--------------------------------------------------------------------------------

සමාගමේ පරිපාලනය 2015 සැප්තැම්බර් 25 දින සිට නිසි බලධාරියෙකු යටතේ සිදුවන අතර විගණිත දිනය වූ 2017 ජූනි 01 දක්වාම අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් නොකිරීම හේතුවෙන් 2007 අංක 07 දරන සමාගම් පනතේ 133 (1) වගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට නොහැකි වී තිබුණි. එම හේතුවෙන් 2016 වර්ෂය සඳහා සමාගමේ ලාභාංශය ප්‍රකාශයට පත් කිරීමට තිබෙන අවස්ථාවද අහිමි වී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 49,787,271 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 9,297,372 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.40,489,899 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව විකුණුම් ආදායම රු. 38,351,803 කින් හා ස්ථාවර තැන්පතු සඳහා පොලි ආදායම රු. 7,117,953 කින් ඉහළ යාම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

### 4.1 කාර්යසාධනය

-------------------

රාජ්‍ය අනුග්‍රහය යටතේ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය හා අලෙවිකරන කටයුතු සම්බන්ධව වෙළඳපොල පෙර ගමන්කරු ලෙස පත්වීම දැක්ම කරගනිමින් ක්‍රියාත්මක වන මෙම සමාගම, 1950 දශකයේදී කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පරන්තන්හි අක්කර 225 ක පිහිටි භූමි භාගයක රජයේ කර්මාන්ත ශාලාවක් වශයෙන් ස්ථාපනය කරන ලදුව, 1957 අංක 49 රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ සංස්ථාපනය කරන ලද්දකි. කර්මාන්තශාලාව මගින් දේශීය ලුණු අමුද්‍රව්‍යක් ලෙස භාවිතා කරමින් ප්‍රධාන නිෂ්පාදන වශයෙන් දියර ක්ලෝරීන්, කෝස්ටික් සෝඩා හා හයිඩ්‍රොක්ලෝරික්ද, අතුරු නිෂ්පාදන ලෙස සින්ක් ක්ලෝරයිඩ් ෆෙරික් ක්ලෝරයිඩ් හා මේස ලුණු වෙළඳ පොළට ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, 1985 වර්ෂයේදී හටගත් ත්‍රස්තවාදී බලපෑම් හේතුවෙන් පරන්තන් රසායනික කම්හලේ

නිෂ්පාදන කටයුතු නවතා දමා ඇති අතර දේශීය කර්මාන්තවලට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ආනයනය කර සැපයීම සිදු කරනු ලැබේ.
සමාගමේ කාර්ය සාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දියර ක්ලෝරීන් ආනයනය සම්බන්ධයෙන් බලපත්‍රය හිමි එකම දේශිය සමාගම පරන්තන් කෙමිකල්ස් සමාගම වුවත් දේශීය නියෝජිතයින් හරහා මෙරටට ආනයනය කිරීමේදී 2016 වර්ෂය තුළ රු.10,258,247 ක මුදලක් කොමිස් වශයෙන් ගෙවා තිබුණි.මෙම පිරිවැය ජාතික ජල සම්පාදන පිරිවැයට සෘජුවම බලපාන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) එකම සැපයුම්කරුවන් පිරිසක් මගින් වර්ෂ ගණනාවක සිට දියර ක්ලෝරීන් ආනයනය කිරීම සිදු කර තිබුණු අතර, සැපයුම්කරුවන්ගේ මිල ගණන් මෙන්ම දේශීය ආනයන කොමිස් මුදල් රේටයන්ද නිතර නිතර වෙනස් කරමින් සමාගමට දියර ක්ලෝරීන් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. විශේෂයෙන් ක්ලෝරීන් සඳහා ජාත්‍යන්තර මිලක් නොපැවතීම හේතුවෙන් සැපයුම්කරුවන් ලබාදෙන දෙන කුමන හෝ මිලකට එකඟ වීමට සමාගමට සිදුවී තිබුණි.

(ඇ) විශාල විදේශ විනිමය ප්‍රමාණයක් විදේශයන්ට ඇදීයාම වළක්වා ගැනීම වෙනුවෙන් පරන්තන් කර්මාන්ත ශාලාව නැවත ඉදිකර පෙර පරිදි නිෂ්පාදන කටයුතු සිදු කිරීමට සමාගමේ අවධානය යොමු විය යුතු අතරම, ස්වාභාවික සම්පත් සහිත භූමියක් සමාගම සතුව පැවතියදී දීර්ඝ කාලීනව රසායන ද්‍රව්‍ය ආනයනය කිරීම තුළින් අනාගතයේදී සිදුවන අවදානම කෙරෙහිද විශේෂ අවධානයක් යොමු කළ යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, ප්‍රධාන කාර්යාලය අළුත්වැඩියා කිරීම, Mini Bleaching Powder ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ සෝඩා ඇෂ් මෙ.ටො. 25 ක් ආනයනය කර සැපයීම ආදී ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණද ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි

## 4.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.1 මාර්ගෝපදේශය අනුව, දේශීය සැපයුම්කරුවන්ගේ හැකියාව සීමා සහිත වන විට ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමක් සිදු කළ යුතු අතරම 3.1.4 මාර්ගෝපදේශය අනුව උපරිම තරගයක් තහවුරු කිරීම සඳහා විවිධ මාධ්‍ය මගින් ප්‍රසම්පාදන දැන්වීම් සඳහා ජාත්‍යන්තර වශයෙන් ප්‍රචාරණයක් ලබා දිය යුතුය. එහෙත් 2016 වර්ෂයේදී මිලදී ගෙන තිබූ එකතුව රු.71,154,664 ක් වූ ක්ලෝරීන් ඇතුළු රසායන ද්‍රව්‍ය ආනයනයේදී එම ක්‍රමයෙන් බැහැරව ජාතික ලංසු ක්‍රමය අනුගමනය කරමින් විදේශීය සමාගම් වෙනුවෙන් දේශීය නියෝජිතයන් මගින් මිල ගණන් කැඳවීම සිදුකර තිබුණි.

(ආ) ඉහත ප්‍රසම්පාදන කිහිපයකට අදාළව සැපයුම්කරුවන් වශයෙන් තෝරා ගන්නා ලද සමාගම් දෙකක අයිතිය හා අධ්‍යක්ෂ ධූරයන් දරනු ලබන්නේ එකම පුද්ගලයන් කණ්ඩායමක් වන අතර, එම කණ්ඩායමෙන් තිදෙනෙකු පරන්තන් කෙමිකල්ස් සමාගමේ සේවය කර සේවයෙන් ඉවත්ව ගිය නිලධාරීන් බව තවදුරටත් නිරීක්ෂණය විය. එම නියෝජිතයින් වෙත 2016 වර්ෂයේදී පමණක් රු.3,080,700 ක කොමිස් ගෙවා තිබුණු අතර මෙවැනි තත්ත්වයක් තුළ ප්‍රසම්පාදනයේ විනිවිදභාවය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්වීමට නොහැකි විය. තවද, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත, 24 ප්‍රකාරව සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

**4.3 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමට අයත් පරන්තන්හි පිහිටි ඉඩමේ කම්බි කණු සිටුවීම සඳහා 2011 වර්ෂයේදී කම්බි කණු 1000ක් රු 1,217,000 ක් වැය කර මිලදී ගෙන තිබුණද, 2017 සැප්තැම්බර් වන විටත් ඉන් කණු 68 ක් පමණක් සිටුවා තිබූ අතර ඉතිරි කම්බි කණු 932 ක් භූමියේ ගොඩගසා තිබුණි.

(ආ) කළුතර නාගොඩ ප්‍රදේශයේ පිහිටුවීමට සැලසුම් කර තිබූ විරංජන කුඩු නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා 2016 අයවැය මගින් රු. මිලියන 40 ක් වෙන් කර තිබුණ ද 2017 සැප්තැම්බර් වන විටත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.4 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පානීය ජලය පිරිසිදු කිරීම සඳහා ක්ලෝරින් අඛණ්ඩව ලබාදීම සමාගමේ ප්‍රධාන කාර්යය වුවද එය ක්‍රියාවට නැංවීමට පවත්වා ගතයුතු තොග මට්ටම් පවත්වා ගැනීමේ වගකීම නිසිපරිදි ඉටුකර නොමැති බව පහත කරුණු අනුව, නිරීක්ෂණය විය.

(i) ජල සම්පාදන මණ්ඩලය වෙත දියර ක්ලෝරීන් මෙ.ටොන් 80ක් මාසිකව අලෙවි කරන අතර එම අවශ්‍යතාවය ද ඇතුළත්ව මෙ.ටොන් 165 ක අවම තොග මට්ටමක්ද දළ අලෙවිය වෙනුවෙන් මෙ.ටොන් 175 ක තොගයක්ද ලෙස මාසික අවශ්‍යතාවය පුරෝකථනය කර තිබූ නමුත් 2016 ජනවාරි සිට 2017 පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදය තුළ එකී තොග මට්ටම් අපේක්ෂිත තත්ත්වයෙන් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර 2017 පෙබරවාරි වන විට තොග මට්ටම ශූන්‍යය කරා එළඹ තිබුණි.

(ii) දියර ක්ලෝරීන් තොග පාලනය සම්බන්ධයෙන් යළි ඇණවුම් මට්ටමක් ( Re Order Level) හා යළි ඇණවුම් ප්‍රමාණයක් ( Re Order Quantity) නිශ්චය කර නොතිබුණි.

(ආ) ක්ලෝරීන් ආනයනය කිරීම, හොරණ ඒකකය වෙත යැවීම, ජල පිරිපහදු මධ්‍යස්ථාන වෙත යැවීම හා විදේශ සැපයුම්කරුවන් වෙත යැවීම වශයෙන් වන චක්‍රීය සංසරන ක්‍රියාවලිය සඳහා සමාගම සතු වනුයේ ග්‍රෑම් 900 සිලින්ඩර් 715 ක් පමණි. තවද, සෑම මාසයකම සිලින්ඩර් 300 ක් වැනි සැලකිය යුතු ප්‍රමාණයක් සැපයුම්කරුවන් අතැතිව පවතින බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව, අවශ්‍ය ක්ලෝරීන් තොග මට්ටම් පවත්වාගෙන යාමට සමාගම සතු සිලින්ඩර් ප්‍රමාණවත් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**4.5 හානි හා පාඩු**

---

2016 පෙබරවාරි 16 දිනැති අංක PCCL/09/$cl_2$/2015/03 දරන ප්‍රසම්පාදනයට අදාළව දියර ක්ලෝරින් මෙ.ටොන් 756 ක් ආනයනය කිරීම සඳහා ලබාදී තිබූ සිලින්ඩර බලපත්‍රයේ සඳහන් නොවූ වරායකට ගොඩබෑම හේතුවෙන් සිලින්ඩර 28 ක් 2017 සැප්තැම්බර් දක්වා නිදහස් කර ගැනීමට නොහැකි වී තිබුණි. එම වත්කම් නිදහස් කර ගැනීමට නොහැකි වුවහොත් සමාගමට සිදුවිය හැකි පාඩුව රු. 6,305,800 ක් පමණ වන බව විගණනයේ දී නිරීක්ෂණය විය.

## 4.6 නිශ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

සමාගමේ ප්‍රධාන කාර්යාලය ඇතුළුව මෙහෙයුම් කටයුතු ස්ථාපනය කිරීම වෙනුවෙන් රු. 25,000,000 ක් වැය කර කාර්යාල ගොඩනැගිල්ලක් හා කුඩා ගොඩනැගිලි දෙකක් 2009 වර්ෂයේදී කළුතර ඉදිකර තිබුණි. එහෙත් මෙම වාර්තාවේ දින වනවිට කුඩා ගොඩනැගිලි දෙක කෝස්ටික් සෝඩා නිෂ්පාදනය හා ගබඩා කිරීම සඳහා 2017 වර්ෂයේදී යොදාගෙන තිබූ අතර දෙමහල් කාර්යාල ගොඩනැගිල්ලේ නිලධාරීන් 4 දෙනෙකු පමණක් සේවය කරන බව නිරීක්ෂණය වූයෙන් එම ගොඩනැගිලි වසර 7 කට අධික කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

## 4.7 කාර්ය මණ්ඩල කළමනාකරණය

ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 2:5:1 වගන්තිය ප්‍රකාර නිලධාරියෙකු තාවකාලිකව මුදාහැරීම අවුරුදු 02 කට සීමා විය යුතු බව සඳහන් වුවද සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා 2002 වර්ෂයේ සිට මෙම වාර්තාවේ දින දක්වා අවස්ථා පහකදී වරින්වර වෙනත් රජයේ ආයතනවලට මුදා හැර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

සමාගම විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, 2014 පෙබරවාරි 14 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2014 හි 04 ඡේදය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන සලසා තිබූ රු. මිලියන 53,300 ක් වූ ප්‍රාග්ධන මිලදී ගැනීම් හා ව්‍යාපෘති, ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

## 5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

සමාගමේ අනුමත අභ්‍යන්තර විගණන තනතුරක් පැවතියද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර 2016 වර්ෂයේදී අභ්‍යන්තර විගණන කටයුතු පුද්ගලික විගණන සමාගමක් මගින් සිදුකර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ නිසිබලධාරියාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණය |
| --- | --- |
| (අ) ණයගැති පාලනය | (i) සමාගමේ විකුණුම් වෙනුවෙන් චෙක්පත් ලබාගැනීමේදී ගැණුම් කරුවන්ට ලබා දී ඇති ණය කාල සීමාව දින 30 ක් වුවත් එය දින 30 සිට 210 ක් වූ කාල පරාසයක් තුළ විහිදී තිබීම. |
| | (ii) දීර්ඝ කාලයක සිට අයවිය යුතු ණය මුදල් අයකර ගැනීමට ක්‍රියා කර නොතිබීම. |
| (ආ) ලේඛන පවත්වාගෙන යාම | චෙක්පත් ලේඛනය, හානි හා පාඩු ලේඛන පවත්වා නොතිබීම. |
| (ඇ) මූල්‍ය පාලනය | (i) නිලධාරීන් ලබාගත් අත්තිකාරම් මුදල් හා සුළු මුදල් පියවීමේදී දීර්ඝ ප්‍රමාදයන් පැවතීම. |
| | (ii) ගෙවීම් වවුචර් නිලධාරීන් කිහිප දෙනෙකු විසින් පිළියෙල කිරීම. |